## නුවණැති ළමයෙකු වීමට නම්

පුංචි අපිව රැවටීමට දරන උත්සාහයන් හඳුනාගෙන පරාජය කිරීමට ක්‍රියාත්මක වෙමු.

- ඇත්තටම අරක්කු, බියර් බොන එක අපහසුවක් වුවත් එය සතුටක් බව පෙන්වන චිත්‍රපටි, ටෙලිනාට්‍ය පිළිබඳව දැනුවත් වෙමු.
- අරක්කු, බියර් බිව්වට පසු ඇත්තටම දැනෙන්නෙ අපහසුව වුවත් වීරත්වයක් ලැබෙන බව පෙන්වන කාටුන්, චිත්‍රපටි, ටෙලිනාට්‍ය පිළිබඳව දැනුවත් වෙමු.
- ඇත්තම ඇත්ත සිගරට්, අරක්කු, බියර් බොන අයට වෙන්නෙ එන්න එන්නම කැතවෙන එක වුවත් චිත්‍රපටි, ටෙලිනාට්‍ය වල ලස්සන ජනප්‍රිය පුද්ගලයන් හරහා සිගරට්, අරක්කු, බියර් බොන අවස්ථා පෙන්වා කරන බොරුව පිළිබඳව දැනුවත් වෙමු.
- සිගරට් බිව්වාම තොල් කැතවෙලා, ප්‍රියමනාප බව අඩුවෙනවා එය ඇත්ත දේ වුවත් ලස්සන ජනප්‍රිය අය සිගරට් බොනවා පෙන්නලා අපි රැවටීමට දරන උත්සාහයන් හඳුනා ගනිමු.
- සතුටු විය හැකි සෑම අවස්ථාවකටම අරක්කු, බියර් එකතු කරලා අරක්කු, බියර්වලින් සතුට ලැබෙනවා කියලා ළමුන් රැවටීමට දරන උත්සාහයන් හඳුනා ගනිමු.
- අපි ළඟ ඉන්න දේවල් නොතේරෙන පහසුවෙන් හසුවන අයටත් මේ ගැන කියලා දෙමු.




### අපි හැමෝම සතුටට කැමතියි

හැමදෙනාම සතුටින් ඉන්න විවිධ දේ කරනවා
සතුට ගිලිහී යනවට කවුරුත්ම
කැමති වෙන්නෙ නැහැ
සතුට කියනදේ විවිධ අය විවිධ විදියට පෙන්නලා
දෙන්න උත්සාහ ගන්නවා

### ඇත්තටම සතුටින් ඉන්න නම් මොනවද අපි දැනගන්න ඕනේ?

සතුටත් එක්ක බැඳුන වචනයක් තමා දුක
දුකෙන් ඉන්න නම් කවුරුත් කැමති වෙන්නෙ නැහැ
දුක විඳින එක සතුටුයි සැපයි කියලා
පෙන්නන්න හදන අයත් ඉන්නවාද ?

## ඇයි නැත්තෙ ?

අමාරුවෙන් දුක් විඳගෙන අරක්කු, බියර් බීලා සතුටුයි, සැපයි කියලා පෙන්නන්න උත්සාහ කරන අය දිහා හොඳට බලන්න අරක්කු, බොනකොට වෙන දේ

- කට ඇඹුකරගෙන
- නහය හකුලගෙන
- ඉක්මනට ගිලිනවා
- බිව්වාම ඇතිවන අප්‍රසන්න බව නැති කරගැනිමට මොනවා හෝ දෙයක් කනවා

### ඇයි ? ඒ අය

දුක් විඳගෙන අරක්කු, බියර් බීලා සතුටුයි කියලා පෙන්නන්න හදන්නෙ....

## ඒ අය රැවටිලාද? කොහොමද රැවටුනේ ?

දුක්විදගෙන අමාරුවෙන්
අරක්කු, බියර් බොන එක මාර සැපක්
කියලා අපිව රවටන්න උත්සාහ කරනවා
කවුද එහෙම කරවන්නෙ ?

කාටද ඒකෙන් ලාබ ලැබෙන්නේ ?
අරක්කු, බියර් සමාගම් වලට

අමාරුවෙන් අරක්කු, බියර් බීලා මාර සැපයි, සතුටුයි කියලා පෙන්නලා ළමයි රවට්ටනවා.



එහෙම රවට්ටන්න කාටූන්, ටෙලිනාට්‍ය, චිත්‍රපටි, කතා පොත්, සිංදු සහ තවත් බොහෝ දේ යොදාගෙන තියෙනවා.

### මේ තියෙන්නේ එයට උදහරණ කිහිපයක්



### මේ හැම උත්සාහයකම ඉලක්කය ළමයි

අපේ යහළුවෙක් හෝ අපේ ගමේ කෙනෙක්
අපිව රවටන්න උත්සහ කළොත්

අපි එයාගෙ උපායට රැවටුනොත්
රැවටුනා කියලා, අපට තේරුණොත්
අපට එයා ගැන තරහක් ඇතිවෙනවා.

ඒ වුනත් අරක්කු, බියර් සමාගම්වල
උපායන් වලට තමන් රැවටුනා හෝ
හසුවුනා කියලා
අනෙක් අයට දැනගන්න ලැබුණට
සමහරුන්ට තරහක් යන්නෙ නැහැ.
එයාලට ඒකවත් තේරුම් ගන්න හැකියාවක් නෑ

අරක්කු, බියර් සමාගම්වල
උපායන්වලට රැවටිලා ඔවුන්ගෙ
රූකඩ බවට පත්වෙලා මදිවට
තමන් රැවටුන සමාගමට තමන් ළඟ ඉන්න
අයත් අල්ලලා දෙනවා

